# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ

**වෙනත් රටවල අධිකරණවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ද; (93 වන අධිකාරය වූ) විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත සහ (94 වන අධිකාරය වූ) නඩු තීන්දු අන්‍යෝන්‍යව බලාත්මක කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ** පනත් කෙටුම්පතකි

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2024 ජුනි මස 19 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජුනි මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[265 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 30.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම,
ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ

එල්.ඩී.-ඕ. 19/2022

**වෙනත් රටවල අධිකරණවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ද; (93 වන අධිකාරය වූ) විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත සහ (94 වන අධිකාරය වූ) නඩු තීන්දු අන්‍යෝන්‍යව බලාත්මක කිරීමේ ආඥාපනත ඉවත් කිරීම සඳහා ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2024 අංක     දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

(2) මේ වගන්තියේ විධිවිධාන හැර මේ පනතේ විධිවිධාන, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත්වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

**පනත අදාළ වීම**

**2.** (1) (අ) (i) ශ්‍රී ලංකාවේ අධිකරණවල සහ යම් විදේශීය රටක අධිකරණවල නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුව සහ ඒ විදේශීය රටෙහි ආණ්ඩුව විසින් යම් සම්මුතියකට ඇතුළත් වන අවස්ථාවක දී; හෝ පනත අදාළ වීම

(ii) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින යම් ලිඛිත නීතියක් මගින් විදේශීය රටක අධිකරණවල නඩු තීන්දු ශ්‍රී ලංකාව තුළ අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා විධිවිධාන සලස්වන අවස්ථාවක දී; සහ

(ආ) මේ පනතේ මේ කොටසේ විධිවිධාන, ඒ විදේශීය රටෙහි අධිකරණවල නඩු තීන්දුවලට ව්‍යාප්ත කිරීම මගින්, ශ්‍රී ලංකාවේ අධිකරණවල නඩු තීන්දු ඒ විදේශීය රටෙහි පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් සාරානුකූල අන්‍යෝන්‍ය සැලකීමක් තහවුරු වනු ඇති බවට අමාත්‍යවරයා විසින් සෑහීමට පත්වන අවස්ථාවක දී,

අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් මේ පනතේ මේ කොටසේ විධිවිධාන ඒ නියමයේ නිශ්චිතව දක්වා ඇති ඒ විදේශීය රටෙහි ඒ අධිකරණවල නඩු තීන්දුවලට ව්‍යාප්ත විය යුතු බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමේ දී, අමාත්‍යවරයා විසින් එසේ කිරීම යෝග්‍ය යයි සලකන්නේ නම්, විදේශ කටයුතු විෂයය පැවරී ඇත්තා වූ අමාත්‍යවරයාගේ සහ නීතිපතිවරයාගේ අදහස් විමසිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන නියමයක් -

(අ) එම නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ දී හෝ එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන යම් පසු දිනයක දී බලාත්මක විය යුතු ය; සහ

(ආ) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි කාලයක් දක්වා හෝ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සම්මුතිය හෝ ලිඛිත නීතිය බලාත්මකව පවතින කාලසීමාවක් දක්වා බලාත්මකව පැවතිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලට සැලකිල්ල යොමු කරමින්, පසුව කරනු ලබන නියමයක් මගින් ඒ උපවගන්තිය යටතේ කලින් සාදන ලද යම් නියමයක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කරනු ලැබිය හැකි ය.

(5) (අ) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම, එම නියමය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ අනුමත නොකරන ලද යම් නියමයක් ඒ යටතේ යථා පරිදි කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) යම් නියමයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මේ පනත අදාළ වන නඩු තීන්දු

**3.** (1) 2 වන වගන්තිය යටතේ පළ කරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති විදේශීය රටක අධිකරණයක නඩු තීන්දුවක් ඒ නඩු තීන්දුවේ පාර්ශ්වකරුවන් අතර අවසානාත්මක සහ තීරණාත්මක වේ නම් පමණක්; සහ

(අ) ඉල්ලුම්කරු විසින් පහත නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලින් එක් කොන්දේසියක් හෝ කොන්දේසි වැඩි ගණනක් සපුරාලනු ලබන්නේ නම්, එනම්-

(i) අවස්ථාවෝචිත පරිදි, විනිශ්චිත ණයහිමියා හෝ විනිශ්චිත ණයගැතියා මුල් අධිකරණයේ නඩු කටයුතුවල පාර්ශ්වකරුවකු බවට පත් වූ අවස්ථාවේ දී ඒ විනිශ්චිත ණයහිමියා හෝ විනිශ්චිත ණයගැතියා මුල් අධිකරණය පිහිටි රටෙහි වාසිකයකුව සිටීම;

(ii) විනිශ්චිත ණයගැතියා ස්වාභාවික තැනැත්තකු වේ නම්, ඒ විනිශ්චිත ණයගැතියා මුල් අධිකරණයේ නඩු කටයුතුවල පාර්ශ්වකරුවකු බවට පත් වූ අවස්ථාවේ දී, ඔහුගේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය මුල් අධිකරණය පිහිටි රටෙහි පැවතීම;

(iii) විනිශ්චිත ණයහිමියා යම් නඩුවක ස්වකීය ඉල්ලීම හෝ හරස් ඉල්ලීම මත පදනම්ව ඒ නඩු තීන්දුව ලබාගෙන ඇති තැනැත්තා වීම;

(iv) විනිශ්චිත ණයගැතියා මුල් අධිකරණයේ නඩු කටයුතුවල පාර්ශ්වකරුවකු බවට පත් වූ අවස්ථාවේ දී, ඒ විනිශ්චිත ණයගැතියා විසින් ඒ මුල් අධිකරණය පිහිටි රටෙහි වෙනම නෛතික පුද්ගලභාවයක් ඇතිව හෝ නැතිව ශාඛාවක්, නියෝජිත ආයතනයක් හෝ වෙනත් ආයතනයක් පවත්වාගෙන ගොස් තිබීම;

(v) විනිශ්චිත ණයගැතියා මුල් අධිකරණයේ අධිකරණ බලයට යටත් වීමට එකඟ වී තිබීම හෝ යටත් වී තිබීම;

(vi) මුල් අධිකරණයේ නඩු කටයුතු පැවති අවස්ථාවේ දී නඩු තීන්දුවට අදාළ චංචල හෝ නිශ්චල දේපළ ශ්‍රී ලංකාව තුළ හෝ මුල් අධිකරණය පිහිටි රටෙහි හෝ පිහිටා තිබීම;

(vii) නඩු තීන්දුවේ දිනය වන විට හෝ ඉන් පසුව ඉල්ලුම්කරුට මුල් අධිකරණයේ නඩුතීන්දුව යටතේ යම් අයිතිවාසිකමක්, සම්බන්ධතාවක්, ප්‍රතිලාභයක්, අයිතියක්, තත්ත්වයක් හෝ හිමිකමක් උපචිත වී තිබීම; හෝ

(ආ) විවාහයක් අවලංගු කිරීම හෝ ශූන්‍ය කිරීම සඳහා වූ නඩු තීන්දුවක් හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ නඩු තීන්දුවක් සම්බන්ධයෙන් වන විට, ඒ විවාහය නියමිත දිනයට පෙර හෝ පසුව ගිවිසගෙන තිබුණ ද, නැතහොත් ඒ නඩු තීන්දුව නියමිත දිනයට පෙර හෝ පසුව ඇතුළත් කර තිබුණ ද, ඒ නඩු තීන්දුව (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද විවාහයක් සම්බන්ධයෙන් ලබාගෙන ඇත්නම් පමණක්, සහ-

(i) විවාහයේ කවර හෝ පාර්ශ්වයක් නඩු තීන්දුවේ දිනයේ දී ඒ රටෙහි පදිංචිව සිටියේ නම්;

(ii) විවාහයේ කවර හෝ පාර්ශ්වයක්, නඩු තීන්දුවේ දිනයට පෙරාතුව ම අවුරුදු එකකට නොඅඩු කාලයක් සඳහා ඒ රටෙහි සාමාන්‍යයෙන් වාසිකව සිටියේ නම්;

(iii) විවාහයේ කවර හෝ පාර්ශ්වයක් නඩු තීන්දුවේ දිනයේ දී ඒ රටෙහි පුරවැසියකු ව සිටියේ නම්; හෝ

(iv) විවාහයේ දෙපාර්ශ්වය ම ඒ අධිකරණයේ අධිකරණ බලයට යටත් ව ඇත්නම්,

පමණක් මේ පනතේ විධිවිධාන ඒ විදේශීය රටෙහි ඒ අධිකරණයේ ඒ නඩු තීන්දුව සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) විදේශීය රටක අධිකරණයක නඩු තීන්දුවක් යටතේ ගෙවිය යුතු යම් බදු, අය කිරීම්, දඩමුදල් හෝ වෙනත් දණ්ඩන සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

II වන කොටස

## විදේශ නඩුතීන්දු පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම

විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ඉල්ලුම් කිරීම

**4.** යම් ඉල්ලුම්කරුවකු විසින් -

(අ) අවසාන නඩු තීන්දුව සත්‍යායනය කරමින් මුල් අධිකරණයේ අදාළ අධිකාරිය විසින් නිකුත් කරන ලද සහතිකයක් ද සමඟ ඒ අවසාන නඩු තීන්දුවේ දිනයේ සිට අවුරුදු දහයක කාලසීමාවක් ඇතුළත; සහ

(ආ) සිවිල් නඩුවිධාන සංග්‍රහයේ II වන කොටසේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ලඝුකාර්ය පටිපාටිය අනුව,

විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමක් මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලැබිය හැකි තොරතුරු සහ ලේඛන ද සමඟ, ඒ රීති මගින් නියම කරනු ලබන ආකෘතියෙන් සහ ආකාරයෙන් ලියාපදිංචි කිරීමේ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, ප්‍රමාදයට හේතු වලංගු හේතු බවට ඉල්ලුම්කරු අධිකරණය සෑහීමට පත්වන පරිදි ඔප්පු කරන්නේ නම්, නඩු තීන්දුවේ දිනයේ සිට අවුරුදු දහයකට පසුව කරන ලද ඉල්ලීමක් ලියාපදිංචි කිරීමට අධිකරණය විසින් භාරගනු ලැබිය හැකි ය:

එසේම තවදුරටත්, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් කිසිදු වාචික සාක්ෂියක් ඉදිරිපත් කිරීම සඳහා පාර්ශ්වකරුවන්ට ඉඩ නොදිය යුතු අතර, විදේශ නඩු තීන්දුව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමේ දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඇතුළත පෙත්සම්, විරෝධතා ප්‍රකාශ, දිවුරුම් ප්‍රකාශ සහ එම පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් ලේඛන පිළිබඳ නඩු කටයුතු අවසන් කරනු ලැබිය යුතු ය.

විදේශ නඩු තීන්දුවක් ලියාපදිංචි කිරීම

**5.** (1) 4 වන වගන්තිය යටතේ විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමක් ලැබීමෙන් පසුව, ඒ ඉල්ලීමේ දිනය වන විට-

(අ) ඒ නඩු තීන්දුව මේ පනත අදාළ වන නඩු තීන්දුවක් බවට;

(ආ) ඉල්ලුම්කරුට මුල් අධිකරණය විසින් දෙන ලද නඩු තීන්දුව යටතේ යම් අයිතිවාසිකමක්, සම්බන්ධතාවක්, ප්‍රතිලාභයක්, අයිතියක්, තත්ත්වයක් හෝ හිමිකමක් උපචිත වී ඇති බවට; සහ

(ඇ) 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත ඉල්ලීම ඉදිරිපත් කර ඇති බවට,

ලියාපදිංචි කිරීමේ අධිකරණය බැලූ බැල්මට සෑහීමට පත්වේ නම්, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ඒ නඩුතීන්දුව ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත ප්‍රකාරව නඩු තීන්දුවක් ලියාපදිංචි කර ඇති අවස්ථාවක දී, ඒ ලියාපදිංචි කරන ලද නඩු තීන්දුව ලියාපදිංචි කිරීමේ අධිකරණයේ දී මුල් අවස්ථාවේ දී දෙන ලද සහ ලියාපදිංචි කිරීමේ දිනයේ දී ඇතුළත් කරන ලද නඩු තීන්දුවක් මෙන් සමාන බලපෑමක් සහ බලාත්මකභාවයක් ඇති ලෙසට ද ඒ නඩු තීන්දුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාන පාලනයක් ඇති ලෙසට ද සලකනු ලැබිය යුතු ය.

(3) විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලීමක් කරන දිනය වන විට මුල් අධිකරණය විසින් ප්‍රදානය කරන ලද සහනයෙන් කොටසක් ඉටුකර ඇති අවස්ථාවක දී, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් නඩු තීන්දුවේ ඉටුකර නොමැති කොටස සම්බන්ධයෙන් පමණක් නඩු තීන්දුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් ශ්‍රී ලංකාව තුළ පිළිගැනීම

**6.** (1) 5 වන වගන්තිය යටතේ විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් ලියාපදිංචි කිරීමෙන් පසුව-

(අ) ඒ විදේශ නඩු තීන්දුව පාර්ශ්වකරුවන් අතර ලබා දී ඇති බව ලියාපදිංචි කිරීමේ අධිකරණයට පෙනී යන අවස්ථාවක, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ඒ නඩු තීන්දුව ශ්‍රී ලංකාව තුළ පිළිගනිමින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) ඒ විදේශ නඩු තීන්දුව ඒකපාර්ශ්විකව ලබාගෙන ඇති බව ලියාපදිංචි කිරීමේ අධිකරණයට පෙනී යන අවස්ථාවක, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ඒ විවාහයේ අනෙක් පාර්ශ්වකරුට දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 59 වන වගන්තියේ සිට 71 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ දැන්වීම භාරදීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, 7 වන වගන්තිය යටතේ වූ කිසිදු විරෝධතාවක් ඉදිරිපත් කොට නොමැති අවස්ථාවක දී සහ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිසි පරිදි දැන්වීම භාර දී ඇති බවට ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් සෑහීමට පත්වීමෙන් පසුව, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ඒ විදේශ නඩු තීන්දුව පිළිගනිමින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය.

විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් ශ්‍රී ලංකාව තුළ පිළිගැනීමට එරෙහි විරෝධතා

**7.** 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් ලැබීමෙන් පසුව විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක වගඋත්තරකරුවකු විසින් ලියාපදිංචි කිරීමේ අධිකරණය ඉදිරියෙහි පෙනී සිට පහත සඳහන් හේතු මත ඒ ඉල්ලීමට විරෝධතා දැක්විය හැකි ය:-

(අ) 4 වන වගන්තියේ දක්වා ඇති අවශ්‍යතාවලින් කවර හෝ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීමට ඉල්ලුම්කරු අපොහොසත්ව ඇති බව;

(ආ) වංචාවක් සිදු වී ඇති බව; හෝ

(ඇ) 4 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමට සහ දිවුරුම් ප්‍රකාශයට අදාළ කාරණා සම්බන්ධයෙන් දුර්නිරූපණයක් සිදු වී ඇති බව.

විරෝධතා ප්‍රතික්ෂේප කිරීම සහ විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම

**8.** (1) 7 වන වගන්තිය යටතේ විරෝධතාවක් ඉදිරිපත් කරන ලද පාර්ශ්වකරුවකු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීම සඳහා 7 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් පවතින බවට ලියාපදිංචි කිරීමේ අධිකරණය සෑහීමට පත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් කරනු ලබන ආඥාවක් මගින් ඒ විරෝධතාව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි අතර, ඒ ඉල්ලීම ඉදිරිපත් කරන ලද්දේ විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් සම්බන්ධයෙන් ද, ඒ විදේශ නඩු තීන්දුව පිළිගනිමින් ප්‍රකාශයක් කරනු ලැබිය යුතු ය.

(2) ඒ ප්‍රකාශ කිරීම, විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුව, ශ්‍රී ලංකාවේ නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් නිකුත් කරන ලද්දක් මෙන් පිළිගනු ලැබීමේ බලපෑම තිබිය යුතු ය.

අධිකරණය විසින් නඩු ගාස්තු ප්‍රදානය කළ හැකි බව

**9.** 4 වන වගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමක් සඳහා අධිකරණය විසින් සුදුසු යයි සලකන නඩු ගාස්තු අධිකරණය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

විවාහ අවලංගු කිරීම ආදිය සඳහා වූ විදේශ නඩු තීන්දු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කිරීම

**10.** විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් සම්බන්ධයෙන් වන විට, ඒ නඩු තීන්දුව පිළිගනිමින් ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ප්‍රකාශයක් කරනු ලබන අවස්ථාවක, ඒ ලියාපදිංචි කිරීමේ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ඒ ප්‍රකාශයේ පිටපතක්, (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ කාර්ය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

ලියාපදිංචි නඩු තීන්දුවක් නිෂ්ප්‍රභ කිරීම

**11.** (1) යම් විදේශ නඩු තීන්දුවක් ලියාපදිංචි කිරීමෙන් පසුව ඕනෑම අවස්ථාවක දී, විනිශ්චිත ණයගැතියා විසින් හෝ ස්වකීය අයිතිවාසිකම්, සම්බන්ධතා, ප්‍රතිලාභ, අයිතීන්, තත්ත්වයන් හෝ හිමිකම් අහිතකර ලෙස බලපෑමට ලක්ව ඇති යම් පාර්ශ්වකරුවකු විසින් තත්කාර්ය සඳහා යථා පරිදි කරනු ලබන ඉල්ලීමක් මත හෝ ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ස්වකීය මෙහෙයවීමෙන් ම -

(අ) 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් නඩු තීන්දුව ලියාපදිංචි කර ඇති බවට;

(ආ) නඩු කටයුතු සඳහා විත්තිවාචක ඉදිරිපත් කිරීමට විනිශ්චිත ණයගැතියාට හැකියාව ලැබෙන පරිදි මුල් අධිකරණය පිහිටි රටෙහි නීතිය ප්‍රකාරව ඔහු වෙත දැන්වීමක් හෝ ප්‍රමාණවත් දැන්වීමක් කරනු ලැබ නොමැති බවට;

(ඇ) ලියාපදිංචි කරන ලද නඩු තීන්දුව වංචනිකව ලබාගෙන ඇති බවට;

(ඇ) නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති තැනැත්තාට මුල් අධිකරණයේ නඩු තීන්දුව යටතේ යම් අයිතිවාසිකමක්, සම්බන්ධතාවක්, ප්‍රතිලාභයක්, අයිතියක්, තත්ත්වයක් හෝ හිමිකමක් උපචිත වී නොමැති බවට; හෝ

(ඉ) මුල් අධිකරණය පිහිටි රටෙහි නීතිය ප්‍රකාරව, මුල් අධිකරණය පිහිටි රටෙහි මුල් අධිකරණය විසින් හෝ ඉහළ අධිකරණයක් විසින් නඩු තීන්දුව ප්‍රත්‍යාවර්තනය කර හෝ නිෂ්ප්‍රභ කර ඇති බවට,

සෑහීමට පත්වන අවස්ථාවක දී, ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් නඩු තීන්දුව ලියාපදිංචි කිරීම නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එසේ කිරීම යෝග්‍ය යයි ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් සලකනු ලබන්නේ නම්, මේ පනත යටතේ නඩු තීන්දුවක ලියාපදිංචිය නිෂ්ප්‍රභ කිරීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙයවීමට ඒ අධිකරණය විසින් පාර්ශ්වකරුවන්ට ඉඩදෙනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ නඩු තීන්දුවක ලියාපදිංචිය නිෂ්ප්‍රභ කිරීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් සිවිල් නඩුවිධාන සංග්‍රහයේ 389 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ යම් නඩු තීන්දුවක ලියාපදිංචිය නිෂ්ප්‍රභ කිරීම මගින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව නඩු තීන්දුවක් ලියාපදිංචි කිරීම සඳහා අලුත් ඉල්ලීමක් ගොනු කිරීම වළක්වාලනු නොලැබිය යුතු ය.

**12.** (1) විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ නඩු තීන්දුවක් නොවන විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් කරන ලද ආඥාවකට එරෙහිව කිසිදු අභියාචනාවක් කරනු නොලැබිය යුතු ය. අභියාචනා

(2) විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා මේ පනතේ

විධිවිධාන යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ප්‍රදානය කරන ලද යම් පිළිගැනීමකින් හෝ කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වකරුවකු විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 154ග වන ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ මහාධිකරණයෙන් පළමුව අවසර ලබා ගැනීමෙන් පසුව, ඒ මහාධිකරණය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

*විවාහයක් අවලංගු කිරීම ආදිය සඳහා වූ විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වෙනම ඉල්ලීම් ඉදිරිපත් කිරීම*

**13.** විවාහයක් අවලංගු කිරීම හෝ ශූන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක දෙපාර්ශ්වය ම විසින් එකම නඩු තීන්දුව පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා වෙනම ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක ලියාපදිංචි කිරීමේ අධිකරණය විසින් ඒ ඉල්ලීම් දෙකම ඒකාබද්ධ කොට එම නඩු කටයුත්තේ දී ම ආඥාවක් කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

*ලියාපදිංචි කරනු ලබන විදේශ නඩු තීන්දු අන්‍යාකාරයකින් බලාත්මක කරනු ලැබිය නොහැකි බව*

**14.** 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියමයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට සහ ඉන්පසුව, ඒ යම් විදේශ රටක අධිකරණයක නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ යම් නඩු කටයුතු, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව මිස, ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් විසින් විභාග කරනු නොලැබිය යුතු ය.

*විදේශ නඩු තීන්දු පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීම් සම්බන්ධයෙන් වන අධිකරණ බලය*

**15.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද-

(අ) විවාහයක් අවලංගු කිරීම හෝ ශූන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ නඩු තීන්දුවක් හැර, මේ පනතේ විධිවිධාන අදාළ වන විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, කොළඹ දිසා අධිකරණයට හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෙනත් යම් අධිකරණයකට; සහ

(ආ) මේ පනතේ විධිවිධාන අදාළ වන, විවාහයක් අවලංගු කිරීම හෝ ශූන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන් වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, කොළඹ දිසා අධිකරණයට හෝ ඒ නඩු තීන්දුවේ යම් පාර්ශ්වකරුවකු පදිංචිව සිටින්නේ යම් දිසා අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බලසීමාව තුළ ද ඒ දිසා අධිකරණයට,

මේ පනත මගින් සහ 20 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වනු ලබන ආකාරයට විභාග කර නිශ්චය කිරීම සඳහා අධිකරණ බලය, ක්‍රියා කිරීමේ අයිතිය සහ පූර්ණ බලය ඇත්තේ ය.

**සිවිල් නඩු විධාන සංග්‍රහය අදාළ වීම**

**16.** මේ පනත යටතේ විදේශ නඩු තීන්දු, අවස්ථාවෝචිත පරිදි, පිළිගැනීමට, ලියාපදිංචි කිරීමට සහ බලාත්මක කිරීමට අදාළ සිතාසි, දැන්වීම් හෝ වෙනත් යම් ලේඛන භාරදීම සිවිල් නඩුවිධාන සංග්‍රහයේ VIII වන සහ XXII වන පරිච්ඡේදවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට සිදු කරනු ලැබිය යුතු ය.

**අධිකරණයට ඉදිරිපත් කරනු ලබන ලේඛනවල භාෂාව**

**17.** (1) විවාහයක් අවලංගු කිරීම හෝ ශූන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන් වීම සඳහා වූ විදේශ නඩු තීන්දුවක් ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂාවකින් වන අවස්ථාවක දී, ඒ නඩු තීන්දුව සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ කථා පරිවර්තකයකු හෝ යම් දිසා අධිකරණයක, පවුල් අධිකරණයක, මහෙස්ත්‍රාත් අධිකරණයක හෝ ප්‍රාථමික අධිකරණයක දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු හෝ කථා පරිවර්තකයකු හෝ දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු විසින් පිළියෙළ කර අත්සන් කරන ලද එහි ඉංග්‍රීසි භාෂාවෙන් වූ පරිවර්තනයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "දිවුරුම් දුන් භාෂා පරිවර්තකයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ දිසා අධිකරණයක දිසා විනිසුරුවරයකු ඉදිරියෙහි ප්‍රතිඥාව දී එයට අත්සන් කර ඇත්තා වූ හෝ දිවුරුම දී එයට අත්සන් කර ඇත්තා වූ භාෂා පරිවර්තකයකු අදහස් වේ.

**දිවුරුම් ප්‍රකාශවල කරුණු පිළිබඳ සාවද්‍ය ප්‍රකාශ කිරීම**

**18.** මේ පනත යටතේ කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක සිතාමතාම සහ වංක ලෙස කරුණු පිළිබඳ යම් සාවද්‍ය ප්‍රකාශ සිදු කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂ දෙකකට නොඅඩු දඩයකට හෝ

අවුරුදු එකකට නොඅඩු කාලසීමාවක් සඳහා බන්ධනාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**19.** මේ පනතේ විධිවිධාන සලස්වා නොමැති යම් කාරණයක් හෝ කාර්යපටිපාටිය පිළිබඳ ප්‍රශ්නයක දී, ඊට සමාන කාරණයක් හෝ ප්‍රශ්ණයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය මේ පනතේ විධිවිධාන සමග අනනුකූල නොවන්නේ නම්, අධිකරණය විසින් ඒ කාරණය හෝ ප්‍රශ්නය සම්බන්ධයෙන් සිවිල් නඩුවිධාන සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය. අත්හැරුනු කරුණු

**20.** (1) මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා රීති සෑදීම සඳහා බලය දී ඇති හෝ රීති සාදනු ලැබිය යුතු යයි නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය. රීති

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:-

(අ) විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා වූ ඉල්ලීමක් ගොනු කිරීම සහ ලියාපදිංචි කරන ලද නඩු තීන්දුවක් නිෂ්ප්‍රභ කිරීම සහ ඒ කාර්ය සඳහා භාවිත කරනු ලබන ආකෘති;

(ආ) මේ පනත යටතේ කරනු ලබන දිවුරුම් ප්‍රකාශවල අන්තර්ගත විය යුතු කරුණු පිළිබඳ ප්‍රකාශ;

(ඇ) මේ පනත යටතේ ගොනු කරනු ලබන ඉල්ලීමක් සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන නියම කිරීම;

(ඈ) විදේශ නඩු තීන්දුවක් පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම සඳහා ඉල්ලීමක් කිරීමේ දී සුරැකුම් ඉදිරිපත් කිරීම;

(ඉ) ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම භාර දිය යුතු ආකාරය සහ ඒ දැන්වීමෙහි අන්තර්ගත විය යුතු කරුණු;

(ඊ) මේ පනතේ ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති කාලසීමාවලට යටත්ව, මේ පනත යටතේ ඉටුකිරීමට නියමිත යම් ක්‍රියාවක් ඉටුකිරීම සඳහා වන කාලසීමාවන්;

(උ) මුල් අධිකරණය පිහිටි රටෙහි නීතිය යටතේ විදේශ නඩු තීන්දුවක් යටතේ ගෙවිය යුතු යම් පොළියක් නිශ්චය කරනු ලැබිය යුතු ක්‍රමවේදය නියම කිරීම;

(ඌ) නඩු ගාස්තු ප්‍රදානය කිරීමට අදාළ කාරණා; සහ

(එ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස මේ පනත යටතේ නියම කිරීමට නියමිත වෙනත් යම් කාරණයක්.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ රීති එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ ඒ රීතියේ නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් දිනයක බලාත්මක විය යුතු ය.

ඉවත් කිරීම

**21.** නියමිත දිනයේ සිට බලපවත්වන පරිදි-

(අ) (93 වන අධිකාරය වූ) විදේශ නඩු තීන්දු බලාත්මක කිරීමේ ආඥාපනත; සහ

(ආ) (94 වන අධිකාරය වූ) නඩු තීන්දු අන්‍යෝන්‍යව බලාත්මක කිරීමේ ආඥාපනත,

පරිච්ඡින්න වන්නේ ය.

ඉතිරි කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන

**22.** (මේ වගන්තියේ "පරිච්ඡින්න කරන ලද ආඥාපනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (94 වන අධිකාරය වූ) නඩු තීන්දු අන්‍යෝන්‍යව බලාත්මක කිරීමේ ආඥාපනත පරිච්ඡින්න කිරීම නොතකා-

(අ) අනුරූප අධිකරණවල නඩු තීන්දු සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන ව්‍යාප්ත කරමින් මේ පනතේ 2 වන වගන්තිය යටතේ නියමයක් නිකුත් කරනු ලබන තෙක්, පරිච්ඡින්න කරන ලද ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ සාදන ලදුව නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පවතින සෑම නියමයක් ම, ඒ නියමයෙහි ප්‍රකාශයට පත් කරන ලද අධිකරණවල නඩු තීන්දු සම්බන්ධයෙන් වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය;

(ආ) පරිච්ඡින්න කරන ලද ආඥාපනත යටතේ ගොනු කරන ලදුව සහ පවරන ලදුව නියමිත දිනයට පෙරාතුවම වූ

දිනයේ දී කටයුතු අවසන් නොවී පවතින සියලු ඉල්ලීම් සහ නඩු කටයුතු පරිච්ඡින්න කරන ලද ආඥාපනතේ විධිවිධාන යටතේ ඉදිරියට පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) පරිච්ඡින්න කරන ලද ආඥාපනත යටතේ ඇතුළත් කරන ලදුව හෝ සාදන ලදුව නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ඉටුකර නොමැති සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා පරිච්ඡින්න කරන ලද ආඥාපනතේ විධිවිධාන යටතේ ඉදිරියට පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**23.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"ඉල්ලුම්කරු" යන්නට, මේ පනතේ කාර්ය සඳහා, නඩු තීන්දුවේ දිනය වන විට හෝ ඉන් පසුව මුල් අධිකරණයේ නඩු තීන්දුව යටතේ යම් අයිතිවාසිකමක්, සම්බන්ධතාවක්, ප්‍රතිලාභයක්, අයිතියක්, තත්ත්වයක් හෝ හිමිකමක් උපචිත වී ඇත්තා වූ විනිශ්චිත ණයහිමියකු හෝ වෙනත් තැනැත්තකු ඇතුළත් වේ;

"සිවිල් නඩු විධාන සංග්‍රහය" යන්නෙන් (101 වනඅධිකාරය වූ) සිවිල් නඩුවිධාන සංග්‍රහය අදහස් වේ;

"මුල් අධිකරණය පිහිටි රට" යන්නෙන්, මුල් අධිකරණය පිහිටා ඇත්තේ යම් රටක ද එම රට අදහස් වේ;

"විවාහයක් අවලංගු කිරීම හෝ ශුන්‍ය කිරීම හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම" යන්නෙන්, මේ පනතේ 2 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක නඩු කටයුතු මගින් ලබාගත් යම් දික්කසාදයක්, විවාහයක් ශුන්‍ය කිරීමක් හෝ විවාහයක පාර්ශ්වකරුවන්ගේ අධිකරණමය වෙන්වීමක් අදහස් වේ;

"රටක පදිංචි වී සිටීම" යන්නෙන්, ඒ රටේ නීතිය ප්‍රකාරව පදිංචි වී සිටීම අදහස් වේ;

"නඩු තීන්දුව" යන්නෙන්, මේ පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වා ඇති විදේශීය රටක නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් දෙන ලද හෝ කරන ලද යම් නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් අදහස් වන නමුත් ඊට-

(අ) ස්වෛරී රාජ්‍යයකට එරෙහිව;

(ආ) යම් වෛවාහක කාරණයක දේපළ නිරවුල් කිරීම සම්බන්ධයෙන්;

(ඇ) බුන්වත්භාවය සම්බන්ධ නඩු කටයුතුවල දී;

(ඈ) සමාගම් ඈවර කිරීමට අදාළ නඩු කටයුතුවල දී;

(ඉ) සිහිවිකලවීමට අදාළ නඩුකටයුතුවල දී;

(ඊ) බාලවයස්කරුවකුගේ ආරක්ෂකත්වය, භාරය හෝ නඩත්තුව හෝ බාලවයස්කරුවකුගේ බූදලයේ ආරක්ෂකත්වය සම්බන්ධ නඩු කටයුතු වල දී ; හෝ

(උ) සිහිවිකල තැනැත්තකුගේ දේපළෙහි ආරක්ෂකත්වය සහ කළමනාකරණය සම්බන්ධ නඩු කටයුතුවල දී,

දෙන ලද හෝ කරන ලද යම් නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් ඇතුළත් නොවේ;

"විනිශ්චිත ණයහිමියා" යන්නෙන්, යම් නඩු තීන්දුවක් දෙන ලද්දේ යම් තැනැත්තකුගේ වාසියට ද ඒ තැනැත්තා අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීම අපේක්ෂා කරනු ලබන නඩු තීන්දුව යටතේ යම් අයිතිවාසිකමක්, සම්බන්ධතාවක්, ප්‍රතිලාභයක්, අයිතියක්, තත්ත්වයක් හෝ හිමිකමක් උපචිත වී ඇති යම් තැනැත්තකු ද ඇතුළත් වේ;

"විනිශ්චිත ණයකරු" යන්නෙන්, නඩු තීන්දුව දී ඇත්තේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා අදහස් වන අතර, ඊට නඩු තීන්දුව බලාත්මක කළ හැක්කේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා ද ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව ප්‍රකාරව අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"මුල් අධිකරණය" යන්නෙන්, යම් නඩු තීන්දුවකට අදාළව, ඒ නඩු තීන්දුව දෙන ලද අධිකරණය හෝ අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා නඩුතීන්දුවක් ස්ථිර කර ඇති හෝ නඩු තීන්දුවක් ඇතුළත් කර ඇති ඉහළ අධිකරණයක් අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නියමිත යන්න අදහස් වේ; සහ

"ලියාපදිංචි කිරීමේ අධිකරණය" යන්නෙන්-

(අ) විවාහයක් අවලංගු කිරීම හෝ ශූන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ නඩු තීන්දුවක් නොවන නඩු තීන්දුවක් සම්බන්ධයෙන් වන විට, කොළඹ දිසා අධිකරණය හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් අධිකරණයක්; සහ

(ආ) විවාහයක් අවලංගු කිරීම හෝ ශූන්‍ය කිරීම සඳහා හෝ විවාහයක පාර්ශ්වකරුවන් වෙන්වීම සඳහා වූ නඩු තීන්දුවක් සම්බන්ධයෙන් වන විට දිසා අධිකරණය හෝ ඒ නඩු තීන්දුවෙහි යම් පාර්ශ්වකරුවකු පදිංචිව සිටින්නේ යම් දිසා අධිකරණයක ප්‍රාදේශීය අධිකරණ බලසීමාව තුළ ද, ඒ දිසා අධිකරණය,

අදහස් වේ.

**24.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව